රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 149.

මගේ අංකය:- ඒ/1
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ
අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය, කොළඹ 07.
1979 ඔක්තෝබර් මස 29 වැනි දින.

සියලුම අමාත්‍යාංශවල ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
රාජ්‍ය සංස්ථාවල හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල
<u>සභාපතිවරුන් වෙත.</u>

## පරිපාලන අභ්‍යාස ආයතනය ප්‍රතිසංවිධානය කිරීම

කළමනාකරණ සංවර්ධනය පිළිබඳව පරිපාලන අභ්‍යාස ආයතනයේ කටයුතු වඩාත් සඵල කිරීමත් රාජ්‍ය අංශයේ සංවිධානවලට ප්‍රයෝජනවත් වන පරිදි එහි වර්තමාන සේවා විෂය ප්‍රමාණය පුළුල් කිරීමත් සඳහා එම ආයතනයේ ව්‍යුහයේ සහ කාර්ය කටයුතු වල ප්‍රතිපත්තිමය හා වැඩ සටහන් පිළිබඳ යම් යම් වෙනස්කම් ඇති කිරීමට තීරණය කර තිබේ. පරිපාලන අභ්‍යාස ආයතනය මුලින්ම පිහිටුවීමේ දී එම ආයතනයෙන් ඉටුකර ගැනීමට අපේක්ෂා කරන ලද පහත සඳහන් අරමුණු වඩාත් ඵලදායක අන්දමින් ඉටුකර ගැනීමට ද මෙම වෙනස්කම් වලින් බලාපොරොත්තු වනු ලැබේ. එනම්:-

(අ) රාජ්‍ය අංශයේ කළමනාකරණ හැකියාවන් වර්ධනය කිරීම සඳහා වැඩ සටහන් සම්පාදනය කිරීම;

(ආ) රජයේ සංවිධානවල අනුගමනය කෙරෙන ක්‍රම දියුණු කිරීමෙන් හා විශේෂඥ උපදේශක වැඩ පැවැරුම් මගින් එම සංවිධානවල මෙහෙයුම් කාර්යක්ෂමතාව වැඩි දියුණු කර ගැනීමට සහායවීම;

(ඇ) සංවර්ධන ක්‍රියාවලියේදී උද්ගත වන අවශ්‍යතා වලට ගැළපෙන ආකාරයෙන් පරිපාලන ව්‍යුහය සකස් වන පරිදි පරිපාලනයේ අවශ්‍ය ප්‍රතිසංස්කරණයන් හා වෙනස්කම් ඇති කිරීම.

(ඈ) ඉහත සඳහන් වැඩ ක්ෂේත්‍රයන්හි පර්යේෂණ අධ්‍යයනයන් පැවැත්වීම.

මෙම අරමුණු පෙරදැරි කරගෙන කළමනාකාර සේවා අංශයේ කළමනාකරණ උපදේශක කටයුතු පරිපාලන අභ්‍යාස ආයතනයට ඒකාබද්ධ කෙරෙන අතර ප්‍රායෝගික පර්යේෂණ හා ප්‍රකාශන පිළිබඳ නව වැඩ සටහන් මගින් එම ආයතනය තවදුරටත් පුළුල් කෙරෙනු ඇත. මෙම ආයතනයෙහි ඇති කරනු ලබන ව්‍යුහමය වෙනස්කම් මගින් කළමනාකරණ උපදේශක කටයුතු, අභ්‍යාස කටයුතු හා පර්යේෂණ කටයුතු එකලස් කෙරෙන අතර එම ආයතනයට පැවරෙන පුළුල් වැඩ ක්ෂේත්‍රය නිසි අවධාරණයක් දැක්වීම සඳහා එය " ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය" යනුවෙන් නැවත නම් කෙරෙනු ඇත. නව වැඩ සටහන් භාර ගැනීමට හැකිවන ආකාරයෙන් ආයතනයේ කාර්ය මණ්ඩලය සහ සම්පත් පුළුල් කෙරෙනු ඇත.

කළමනාකරණ උපදේශක කටයුතු ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයෙන් කෙරෙන බැවින් මෙම අමාත්‍යාංශයේ කළමනාකරණ සේවා අංශය රාජ්‍ය අංශයේ සංවිධානවලට කාර්යාල උපපාලනය සහ කාර්ය මණ්ඩල උපයෝගීකරණය පිළිබඳ විශේෂ ක්ෂෙත්‍රයන්හි දී ඉදිරියටත් සහාය වෙනුවා ඇත. සිය කටයුතු ඉටු කිරීමේදී කළමනාකරණ සේවා අංශය ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය සමග සහයෝගයෙන් යුතුව කටයුතු කරනු ඇත.

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ කටයුතු වල සාර්ථකත්වය ඇත්තවශයෙන්ම රඳා පවතින්නේ රාජ්‍ය අංශයේ සේවාදායි සංවිධාන සමඟ එම ආයතනය පවත්වාගෙන යන ක්‍රියාශීලී සහයෝගිතාව හා නිරතුරුවම කෙරෙන අදහස් හුවමාරුව මතය. එහෙයින් යථෝක්ත අරමුණ ඉටු කර ගැනීම පිණිස ඔබේ සහයෝගය ලබාදෙන ලෙස ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිනු ලැබේ.

අපේක්ෂිත වෙනස්කම් 1979 නොවැම්බර් 01 වන දින සිට ක්‍රියාත්මක වෙනවා, ඇත.

Siriwardhana

ඩී. බී. අයි. පී. එස්. සිරිවර්ධන
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ
අමාත්‍යාංශයේ ලේකම්.